# පලාවර්ග පැකට් කරන්න පළමුවෙන්ම පටන් ගත්තෙ මමයි

ගමින් ගමට

## ජානකි කත්‍රිආරච්චි

අපේම හිතවතියන් වන ඔබගේ විවිධ දක්ෂතා එළිදැක්වීම වෙනුවෙන් වෙන්ව තිබෙන ගමින් ගමට විශේෂාංගයේදී අපට බොහෝ වශයෙන් හමුවන්නේ රූපලාවන්‍ය හෝ කලා ක්ෂේත්‍රයේ නියැලී සිටින දක්ෂතා පිරි යුවතියන්, මව්වරුන්ය. පිළියන්දල තුම්බෝවිල ගංගාරාම පාරේ අංක 28 හි පදිංචිව සිටින ජානකී කත්‍රිආරච්චි නියැලී සිටිනුයේ මේ ක්ෂේත්‍රයන් දෙකකටම පරිබාහිර වු කටයුත්තකය. වසර දහයක් පුරා බිම්මල් වගා කරන ඇය මේ වනවිට පලා වර්ග සහ එළවළු පැකට් කර වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ ව්‍යාපාරයකද නිරත වෙනවා. ඊට අමතරව මල් පෝච්චි කුලියට සැපයීමද සිදු කරන ඇය මේ සියලු කටයුතු පිළිබඳ අපට කිව්වේ මෙහෙමයි.

අපේ ගෙදරට පලා වර්ග ගෙන ආ විට ආහාරයට ගන්නෙ එක සැරයයි. දන්නෙම නැතිව ඉතිරි ටික නරක් වෙනවා. මේක වුණේ පලා වර්ග සුද්ද කරන්න මට තිබුණු කම්මැලිකම නිසයි. මේ නිසා පිළියෙල කළ පලා වෙළෙඳ පොළෙන් ගන්න තිබෙනවා නම් කියලා මට හිතුනා. මේ වැඩේ මම අත්හද බැලුවා. හැමෝම කිව්වේ ඔය වැඩේ කරන්න බෑ කියලයි. මම තමයි පලා වර්ග පැකට් කරන්න පටන් ගත්තු ලංකාවේ පළමුවැනියා. ගන්නෝරුව කෘෂිකර්ම පර්යේෂණ ආයතනයෙන් උපදෙස් ලබාගත්තා.

ගොටුකොළ, මුකුණුවැන්න, කංකුං ආදී සෑම පලාවර්ගයක්ම පාහේ සෝද පිරිසිදු කර සිහින්ව ලියා පැකට් කරන අතර සුප් එකකට හෝ නූඩ්ල්ස් එළවළු බතක් වැනි දෙයකට යොදගත හැකි ආකාරයෙන් එළවළු වර්ග ඉහත ආකාරයට සකස් කර වෙළෙඳ පොළට ඉදිරිපත් කරන අතර සෑම පලාවර්ගයක්ම තම වගාවෙන් ලබාගන්නා බවද ඇය පවසනවා.

එක කොළයක් හෝ කහපාට වී තිබුණොත් ඒ පැකට් එකම ගන්න දෙයක් නැති වෙනවා. මේ නිසා ඉතා පිරිසුදුව සහ අලුත් පලා සහ එළවළු වර්ග යොදගත යුතු වෙනවා. අපි කල් තබා ගැනීමට කිසිම රසායනික ද්‍රව්‍යයක් යොදන්නෙ නැහැ. අපේ පලා කොටුවලට යොදන්නෙත් බිම්මල් වගාවට යොදගත් දහයියා කොම්පෝස්ට් පොහොර බවට පත් කරලයි. අඩු තරමින් ලුණු ටිකක්වත් දන්නෙ නැහැ. කාබනික පොහොර භාවිතා කරන්නෙම නැහැ.

තම නිෂ්පාදන ශීතකරණයක තබා සතියක පමණ කාලයක් තබාගත හැකි බව පවසන ඇය එසේ නොමැතිනම් දිනයක් තුළදී ආහාරයට ගත යුතු බව පවසනවා. එහි සේවකයන් දස දෙනෙකු සේවය කරන අතර තම සැමියා වන සුජීව බාලසූරියගෙන් ලැබෙන සහය අගය කරන ජානකී දෙදරු මවක්ද වෙනවා.

මේ වැඩේ පහසු දෙයක් කියා සමහරු හිතන්න පුළුවන්. ඒත් මේ සඳහා උපරිම





කැපවීමක් අවශ්‍යයි. අපිට එළවළු සහ පලාවර්ග පහසුවෙන් කපා ගැනීමට යන්ත්‍රයක් අවශ්‍ය වුණත් ලංකාවෙ කොතැනකවත් එවැනි යන්ත්‍රයක් ලබා ගැනීමට නැහැ. එවැන්නක් යම් කෙනෙක් නිර්මාණය කළහොත් එය මිලදී ගැනීමට අපි සූදනම්. "ත්‍රී ස්ටාර් ප්‍රොඩක්ට්" නමින් නම් තබා තිබෙන ඇයගේ නිෂ්පාදන පිළිබඳ කතා කරමින් ඇය එවැනි ආරාධනාවක්ද කළා. එමෙන්ම තම කටයුතු කරගෙන යාමට දිරිදෙන පිළියන්දල සම්පත් බැංකුවටත් එම නිෂ්පාදන මිලදී ගන්නා වෙළඳ ආයතන සහ පාරිභෝගිකයන්ටත් තම ප්‍රණාමය පුද කිරීමටද ඇය අමතක කළේ නැහැ.

උපේක්ෂා